# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 297/7 — 1977 දෙසැම්බර් 28 වැනි බදාදා — 1977.12.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිතිවල ලියාපදිංචි කරන ලද අතුරු ව්‍යවස්ථාවල 23 වෙනි අතුරු ව්‍යවස්ථාව පරිදි සහ සීමාසහිත කොළඹ උතුරු සමුපකාර සමිතියේ සහ සීමාසහිත කොළඹ දකුණ සමුපකාර සමිතියේ ලියාපදිංචි කරන ලද අතුරු ව්‍යවස්ථාවේ 22 වෙනි අතුරු ව්‍යවස්ථාව පරිදි සකස් කරන ලද නියෝග

විවිධ සේවා සමුපකාර සමිතිවල ලියාපදිංචි කරන ලද අතුරු ව්‍යවස්ථාවේ 23 වෙනි අතුරු ව්‍යවස්ථාව පරිදි සහ කොළඹ සීමාසහිත උතුර සමුපකාර සමිතියේ සහ සීමාසහිත කොළඹ දකුණ සමුපකාර සමිතියේ ලියාපදිංචි කරන ලද අතුරු ව්‍යවස්ථාවේ 22 වෙනි අතුරු ව්‍යවස්ථාව පරිදි මා වෙත පැවරී ඇති බලතල අනුව සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් කැන්දත් රංජිත් මාහිමන් විතාන වන මම සමුපකාර සමිතියක ප්‍රාදේශික කාරක සභා තෝරා ගැනීම සම්බන්ධයෙන් අංක 232/12 සහ 1976 සැප්තැම්බර් 30 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මෙයින් අවලංගු කරන අතර ඒ වෙනුවට පහත සඳහන් නියෝග මෙයින් සාදමි.

ආර්. එම්. විතාන,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

කොළඹ, 1977 දෙසැම්බර් මස 28 වැනි දින.

කෙටි නාමය.—මෙම නියෝගයන්ට විවිධ සේවා සමුපකාර සමිතියක සහ කොළඹ උතුර සහ කොළඹ දකුණ සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභාවක් තෝරා පත් කිරීමේ නියෝගයයි කියනු ලැබේ.

(I) ඡන්දදායක ලැයිස්තුව.—2.1 විවිධ සේවා සමුපකාර සමිතියක ලියාපදිංචි කරන ලද අතුරු ව්‍යවස්ථාවේ 22(I) වෙනි අතුරු ව්‍යවස්ථාව පරිදි සහ සීමාසහිත කොළඹ උතුර සමුපකාර සමිතියේ සහ සීමාසහිත කොළඹ දකුණ සමුපකාර සමිතියේ ලියාපදිංචි කරන ලද අතුරු ව්‍යවස්ථාවේ අතුරු ව්‍යවස්ථා අංක 21(1) වෙනි අතුරු ව්‍යවස්ථාව අනුව තෝරා පත් කර ගත යුතු කාරක සභිකයින් ප්‍රමාණය තෝරා ගැනීම සඳහා ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයින්ගේ ලැයිස්තුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිටපත් 3ක් බැගින් සෑම වර්ෂයේම මාර්තු මස 31 වෙනි දින ජූනි මස 30 වෙනි දින සැප්තැම්බර් මස 30 වෙනි දින හා දෙසැම්බර් මස 31 වෙනි දින හා යන මේ දිනයන්හි අවසන් වන එක එක තුන්මාසය සඳහා සකස් කළ යුතුය. මේ ලැයිස්තු ඒ එක එක තුන් මාසය අවසන්වී දින 10ක් ඇතුලත සකස් කල යුතුය. මෙයින් එක පිටපතක් ප්‍රාදේශිකයේ කාර්යාලයෙහි ප්‍රසිද්ධ ස්ථානයක ද තවත් පිටපතක් ප්‍රාදේශිකයේ වෙළඳ කටයුතු කරන ස්ථානයෙහි ප්‍රසිද්ධ ස්ථානයක ද දින 10ක් ප්‍රදර්ශනය කළ යුතු වේ.

2.2 ඉහත 2.1 නියෝගයෙහි සඳහන් ලැයිස්තුවෙහි නම ඇතුලත් වීමට සුදුසුකම් ඇති යමකියිවකුගේ නම එසේ ඇතුලත්වී නැත්නම් එය ඇතුලත් කර ගැනීම සඳහා ඒ ලැයිස්තුව ප්‍රදර්ශනය කල දින සිට දින 10ක් ඇතුලත අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඔහුට හෝ ඇයට පුළුවන් වේ. එවැනි අභියාචනා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සලකා බලා යම් සංශෝධන අවශ්‍ය නම් එම ලැයිස්තුව ප්‍රදර්ශන කල යුතු අවසාන දිනයේ සිට දින 10ක් ඇතුලත එම සංශෝධන ඉහත ලැයිස්තුවට ඇතුලත් කල යුතු වේ.

2.3 ප්‍රාදේශිකයේ තම නම ලියාපදිංචි වී ඇත්තා වූ සමිතියේ ඕනෑම සාමාජිකයෙකුට 2.1 වෙනි නියෝගයෙහි සඳහන් ලැයිස්තුවෙහි යම් කිසිවෙකුගේ නාමක් ඇතුලත් කිරීම ගැන ලිඛිතව විරුද්ධත්වයක් ප්‍රකාශ කළ හැකි අතර එම විරුද්ධත්වය සම්බන්ධයෙන් හේතු ද එම ලිපියේ සඳහන් විය යුතු වේ. මෙවැනි විරුද්ධත්වයක් ප්‍රකාශ කල හැක්කේ එම ලැයිස්තුව ප්‍රදර්ශනය කල දා සිට දින 10ක් ඉක්මවන්නට ප්‍රථමයෙන්ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවැනි විරුද්ධත්වයක් සලකා බැලිය යුතු අතර යම් සංශෝධනයක් අවශ්‍ය නම් එම ලැයිස්තුව ප්‍රදර්ශනය කිරීමට නියමිත අවසාන දිනයේ සිට දින 10ක් ඇතුලත එවැනි සංශෝධන එම ලැයිස්තුවට ඇතුලත් කල යුතු වේ.

2.4 2.2 නියෝගය සඳහන් අභියාචනා ද 2.3 නියෝගය සඳහන් විරුද්ධතාවයන් ද ගැන අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නියමිත කාල සීමාව ඇතුලත ක්‍රියා නොකල හොත් එවැනි අභියාචනයන් ගැන කරුණු විමසා විරුද්ධත්වයක් ගැන කරුණු පරීක්ෂා කර එම ලැයිස්තුව සංශෝධනය කිරීමට කොමසාරිස් තුමාට බලය සහ අවශ්‍ය වුවහොත් ඡන්දදායක ලැයිස්තු නිසි පරිදි සංශෝධනය කල හැකිය. ඡන්ද ලැයිස්තු එසේ සංශෝධනය කිරීමේදී එය සාමාන්‍යාධිකාරී විසින් පිළියෙල කරන ලදුව සභාපති හා අධ්‍යක්ෂවරයෙකු විසින් සහතික කල යුතු වේ. මෙසේ පිළියෙල කරන ලද ඡන්ද ලැයිස්තු අනුව ඡන්දය පැවැත්විය යුතුය.

2.5 සෑම ප්‍රාදේශිකයක් සඳහාම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරන ලද අවසාන ඡන්ද ලැයිස්තු කෙදිනක් තුලු සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කල යුතුය.

2.6 නියෝග 2.1 යටතේ සඳහන් කරන ලැයිස්තු සාමාන්‍යාධිකාරී විසින් සකස් නොකරන ලද නම් හෝ නියෝග 2.2 හා 2.3 යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංශෝධන නොකරන ලද නම් හෝ නියෝග 2.4 යටතේ සහතික නොකරන ලද නම් හෝ නියෝග 2.5 යටතේ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් නොකරන ලද නම් කොමසාරිස්වරයා විසින් වෙනත් නිලධාරියෙකු ලවා ඡන්දය පැවැත්වීමට සුදුස්සන්ගේ ඡන්ද ලැයිස්තු සකස් කර සහතික කරවා ඒ සඳහා යන වියදම් එම කාර්යය පැහැර හරින ලද සාමාන්‍යාධිකාරී ගෙන් හෝ සමිතියේ අධ්‍යක්ෂක මණ්ඩලයෙන් අය කර ගත හැක. අනතුරුව එම ලේඛනය අනුව ඡන්දය පැවැත්විය යුතුය.

### සාමාන්‍ය කරුණු

### ඡන්ද නිලධාරීන් හා සහකාර ඡන්ද නිලධාරීන් පත් කිරීම

3.1 කොමසාරිස්තුමා විසින් සෑම විවිධ සේවා සමුපකාර සමිතියක් හා වෙනත් සමිතියක් සඳහාම මෙම රීති මාලාව යටතේ ඡන්ද නිලධාරියෙකු හා අවශ්‍ය ප්‍රමාණයට සහකාර ඡන්ද නිලධාරීන් ද පත් කල යුතුය. එවැනි පත් කිරීම මෙයට යාකර තිබෙන " ඩී " ආදර්ශ ආකෘතියක විය යුතුයි.

3.2 එසේ කොමසාරිස්තුමා විසින් පත් කරනු ලබන ඡන්ද නිලධාරීන් හා/සහකාර ඡන්ද නිලධාරීන්ට මෙම රීති මාලාව යටතේ කොමසාරිස්තුමාට පමණක් භාවිතා කල හැකි බලතල හැර අනෙකුත් සියළු බලතල භාවිතා කල හැක.

1 A—ඒ 31381—12,575 (77/12)

3.3 කොමසාරිස්තුමා විසින් නාම යෝජනා පත්‍ර භාර ගැනීමේ හා ඡන්ද විමසීමේ දිනයන් කල් තබා නියම කල යුතුය. එවැනි දිනයන් වෙනස් කිරීමේ බලය ද ඔහු සතු වේ.

3.4 නාමයෝජනා පත් භාරගත් අවස්ථාවේ සිට ඡන්ද ප්‍රතිඵල නිකුත් කරන අවස්ථාව දක්වා ඡන්දය නිසියාකාරයෙන් පැවැත්වීම සම්බන්ධව ඡන්ද නිලධාරීන්/සහකාර ඡන්ද නිලධාරී තැන වගකිව යුතුය. මෙම රීති මාලාවේ නියෝග 5.1 හා 13.2 යටතේ ඡන්ද ප්‍රතිඵල සමිතියට දැන්විය යුතු අතර සෑම අවස්ථාවකදීම කොමසාරිස්තුමාගේ උපදෙස් පිළිපැදිය යුතුය.

3.5 නාම යෝජනා පත් හා ඒවාට ඇති විරුද්ධතාවයන් භාරගන්නා දිනය වේලාව හා ස්ථානය ඡන්ද නිලධාරී තැන විසින් අඩු වශයෙන් දින 7කට වත් කලින් සමිතියේ ලේකම් තැන වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

3.6 ඒ සමගම ඡන්ද නිලධාරී තැන විසින් නිවේදනයේ සෑහෙන පිටපත් සංඛ්‍යාවක් සමිති ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශිකයේ, ප්‍රාදේශික බල ප්‍රදේශ තුල හා අනෙකුත් වැදගත් ස්ථානවල ප්‍රදර්ශනය කිරීම සඳහා ඉදිරිපත් කල යුතු ය.

3.7 ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී විසින් ප්‍රාදේශික කාරක සභාව සඳහා ඡන්දය පැවැත්වෙන දිනය හෝ දිනයන් වේලාව හා ස්ථානයන් සම්බන්ධයෙන් තීරණයක් ගත යුතු අතර නියෝග 2.5 හෝ 2.6 අනුව සහතික කරන ලද අවසාන ඡන්ද ලේඛනය අනුව ඡන්දය පැවැත්විය යුතුය.

3.8 මෙම රීති මාලාව යටතේ ඡන්ද විමසීමේදී ඡන්ද නිලධාරීට/සහකාර ඡන්ද නිලධාරීට අවශ්‍ය විය හැකි සෑම සහයක්ම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය හා එම සමිතියේ සේවක මණ්ඩලය විසින් නොඅඩුව දිය යුතුය.

## දෙවන කොටස

### නුසුදුසුකම්

4.1 පහත සඳහන් සාමාජිකයින් ප්‍රාදේශික කාරක සභාවට තෝරා පත් කිරීම හෝ තෝරා පත්කිරීමට නාම යෝජනා කිරීම හෝ කල නොහැකිය.

(අ) එම ප්‍රාදේශිකයෙහි ඡන්ද ලැයිස්තුවෙහි නම සඳහන් වී නැති කෙනෙක්,

(ආ) වයස අවුරුදු 21ට අඩු කෙනෙක්,

(ඇ) පසුගිය තුන් වර්ෂය තුළ දුෂ්චරිතය සම්බන්ධ නඩුවකින් වරදකරුවෙකු වූ කෙනෙක් හෝ තුන් මසක ට අධික කාලයක් සිර දඬුවමක් ලැබීමට නියම වූ කෙනෙක්,

(ඈ) බන්කොලොත් වීමට ඉල්ලා තිබෙන කෙනෙක් හෝ බන්කොලොත් කාරයෙකු වශයෙන් උසාවිය පිළිගත් කෙනෙක්,

(ඉ) මෙ සමිතියෙන් හෝ ලියාපදිංචි කල වෙනත් සමුපකාර සමිතියකින් හෝ ලබාගත් ණයක් හෝ ගෙවිය යුතු වෙනයම් මුදලක් හෝ ආපසු ගෙවීම පැහැර හැර තිබෙන කෙනෙක්,

(ඊ) වෙළෙන්දෙකු වශයෙන් සමිතිය ලියාපදිංචි වී සිටින කෙනෙක් හෝ සමිතියේ දියුණුවට බාධාවන යම් ව්‍යාපාරයක යෙදී සිටින කෙනෙක්,

(උ) සමිතියෙන් ආදයමක් හෝ ලාභයක් ලැබෙන නිලයක් හෝ තනතුරක් හෝ උසුලන කෙනෙක් හෝ කොමසාරිස්තුමාගේ පූර්ව අනුමැතිය නොමැතිව සමිතියෙන් පාරිතෝෂික මුදලක් ලබන කෙනෙක්,

(ඌ) මෙ සමිතියේ හෝ මෙ සමිතියේ සාමාජිකත්වය දරණ වෙනත් සමිතියක හෝ වැටුප් ලබන සේවකයෙක්,

(එ) සමිතිය සමග ඇතිකර ගන්නා ලද ගිවිසුමක් හෝ සමිතිය යම් විකිණීමක් හෝ මිලයට ගැනීමක් හෝ සමිතියේ මුදල් සම්බන්ධයෙන් එවකට ඇතිකරගෙන තිබෙන්නාවූ ද, ඇතිකර ගැනීමට [illegible] ගිවිසුමක් හෝ ගනුදෙනුවක් පිළිබඳව සාමාජිකයෙකු වශයෙන් හැර තමන්ගේ හෝ අන්කිසි අයෙකුගේ මාර්ගයෙන් හෝ සම්බන්ධයක් ඇති කෙනෙක්,

(ඒ) සමුපකාර නීතිය යටතේ පනවා ඇති නියෝග පරිදි, පසුගිය 5 වර්ෂය ඇතුළත තම නිලයෙන් හෝ සේවයෙන් පහ කරනු ලැබූ කෙනෙක්,

(ඔ) තම සහල් සලාක පොත හෝ සංකේත පත්‍රය හෝ සමිතියට අනුයුක්ත කර නැති කෙනෙක්,

(ඕ) සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම තාවකාලික අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ ප්‍රාදේශික කාරක සභාව විසින් හෝ සලකා බලනු නො ලැබූ කෙනෙක් හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට ආයාචනයක් ඉදිරිපත් කරන ලද හෝ සමුපකාර නීතියේ 60 (2) ඡෙදය යටතේ කොමසාරිස් තුමා විසින් සංශෝධනය කරන ලද හෝ මෙම රීති මාලාවේ 2.4 හෝ 2.6 යටතේ හෝ ඡන්ද ලේඛනයේ නම ඇතුළත්ව නොමැති කෙනෙක්,

(ක) නාම යෝජනා පත්‍ර භාර ගැනීමට නියමිත දිනයට පෙර සාමාජිකත්වය නැතිවූ කෙනෙක්,

### නාම යෝජනා

5.1 නාම යෝජනා පත්‍ර.—ප්‍රාදේශික කාරක සභාවට තෝරා පත්වීමට ඉදිරිපත් වන සෑම ඡන්ද අපේක්ෂකයා ගේම නම සමිතියේ සාමාජිකයෙකු විසින් යෝජනා කර තවත් සාමාජිකයෙකු විසින් ස්ථිර කළ යුතුය. සියළුම ඡන්ද අපේක්ෂකයන්ම ඔවුන්ගේ නම් යෝජනා කරන අයද ඒවා ස්ථිර කරන අයද ඡන්ද විමසීම පවත්වන ප්‍රාදේශිකයෙහි ඡන්ද දායක ලැයිස්තුවෙහි නම සඳහන්වී ඇති සාමාජිකයින් විය යුතුය. ඡන්ද අපේක්ෂකයින්ගේ නාම යෝජනා කිරීම හා ස්ථිර කිරීම මෙ නියෝග මාලාවෙහි 'අ' උපලේඛනයෙහි නියමිත ආකෘති පත්‍රයෙහි ලියවිල්ලකින් කළ යුතුය.

### ඡන්ද අපේක්ෂක යෝජනාකරු හා ස්ථිරකරුගේ ප්‍රකාශනය

5.2 සෑම ඡන්ද අපේක්ෂකයාම මෙ නියෝග මාලාවේ 'ආ' උපලේඛනයේ නියමිත ආකෘති පත්‍රයෙහි ප්‍රකාශනයක් තම නාම යෝජනා පත්‍රවලට ඇමිණිය යුතුය.

5.3 යෝජනාකරු හා ස්ථිරකරු විසින්ද ඡන්ද අපේක්ෂකයකු මෙන්ම මෙම නියෝග මාලාවේ උපලේඛන (ආ) 1 අනුව ප්‍රකාශනයක් කළ යුතුය.

### නාම යෝජනා පත්‍ර භාර ගැනීම

6.1 සමිති ප්‍රාදේශික කාරක සභාවක් තෝරා ගැනීම සඳහා නාම යෝජනා පත්‍ර භාර ගැනීමට නියම කළ දින නියමිත ස්ථානයට ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී පැමිණ සිටිය යුතු අතර භාර දෙනු ලබන නාම යෝජනා පත් භාරගත යුතුය.

6.2 සෑම නාම යෝජනා පත්‍රයක්ම පිටපත් 4කින් සකස් කළ යුතු අතර ඒ සඳහා උප ලේඛන 'අ' පාවිච්චි කළ යුතුය. නාම යෝජනා පත්‍රය යෝජනා කරු හා ස්ථිර කරු විසින්ද ඡන්ද අපේක්ෂකයා විසින්ද අත්සන්කර තිබිය යුතු අතර එය 'අ' හා 'ආ' (1) ප්‍රකාශයන්ද සමග නාම යෝජනා පත්‍ර භාර ගැනීමට නියමිත දින පෙරවරු 9.00 – 10.00 දක්වා කාලය තුල අපේක්ෂකයා විසින්ම හෝ යෝජනාකරු හෝ ස්ථිර කරු විසින්ම ඡන්ද නිලධාරී තැනට/සහකාර ඡන්ද නිලධාරී තැනට භාරදිය යුතුය.

6.3 එසේ භාරගනු ලබන නාම යෝජනා පත් ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී විසින් පරීක්ෂා කර බලා ඡන්ද අපේක්ෂක, යෝජනාකරු හා ස්ථිරකරු නියෝග මාලාවේ 4.1 ඡෙදය අනුව නුසුදුසුයන් වේ නම් හෝ නියෝග මාලාවේ 5.1 හෝ 5.2 හෝ 5.3 ඡේද අනුව නාම යෝජනා පත් අසම්පූර්ණ වේ නම් එම නාම යෝජනාපත්‍ර ප්‍රතික්ෂේප කළ යුතුය.

6.4 ඉන්පසු ඡන්ද නිලධාරී තැන/සහකාර ඡන්ද නිලධාරී තැන ඉහත 6.3 නියෝගය යටතේ තමා විසින් ප්‍රතික්ෂේප නොකරන ලද සෑම නාම යෝජනා පත්‍රයකම පිටපත් 2ක් නාම යෝජනා පත් භාරගත් ස්ථානයේ ප්‍රකටව ප්‍රදර්ශනය කළ යුතුය.

### විරුද්ධත්ව භාර ගැනීම

7.1 ඡන්දය විමසන ප්‍රාදේශිකයේ ඡන්ද දායක ලැයිස්තුවේ නම සඳහන්වී ඇති ඕනෑම කෙනෙකුට ඕනෑම නාම යෝජනාවක් ගැන විරුද්ධත්වයක් ඉදිරිපත් කළ හැකිය. එවැනි විරුද්ධත්වයක් ලිඛිතව කළ යුතුය. තවද එවැනි විරුද්ධත්ව නාම යෝජනා පත් භාරගන්නා දින පෙ. ව. 10.00 – 11.00 දක්වා කාලය තුලදී ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී විසින් භාර ගනු ලැබේ.

7.2 විරුද්ධත්වයන් ඉදිරිපත් කළ හැක්කේ පහත සඳහන් කරුණු නිසා පමණක්මය :—

(අ) නාමය යෝජනා කර ස්ථිර කරනු ලැබුවාවූ ඡන්ද අපේක්ෂකයා ඉහත 4.1 වෙනි නියෝගයේ විධි විධාන එකක් හෝ වැඩි ගණනක් යටතේ නුසුදුසුවීම,

(ආ) ඡන්දාපේක්ෂක හෝ නාම යෝජනා හෝ ස්ථිරකරු හෝ ඡන්දදායක ලැයිස්තුවෙහි නම ඇතුළත් වී නැති කෙනෙක් වීම.

... විරුද්ධත්වයක් ඡන්ද නිලධාරී තැන / සහකාර ඡන්ද නිලධාරී තැන පිළිගත් විට ඒ විරුද්ධත්වයට අදාල නාම

7.4 7.2(අ) නියෝගය යටතේ විරුද්ධත්ව කෙසේ වෙතත් ඡන්ද නිලධාරී තැන/ සහකාර ඡන්ද නිලධාරී තැන තමා භාරගත් නාමයෝජනා පත්‍ර අනුව ඡන්ද විමසීම පැවැත්වීමට ක්‍රියා කරගෙන යා යුතුය. 7.2 (අ) නියෝගය යටතේ සියළුම විරුද්ධ තාවයන් කොමසාරිස් තුමාට ඉදිරිපත් කළ යුතුවේ. එවිට ඒ සම්බන්ධයෙන් කොමසාරිස් තුමාගේ තීරණ අවසාන තීරණාත්මක තීරණය වේ.

7.5 කොමසාරිස් තුමා විසින් 7.2 (අ) නියෝගය යටතේ විරුද්ධත්වයක් පිළිගත් විට ඒ ඡන්දාපේක්ෂකයාගේ තෝරා පත්වීම ඒ කරුණින්ම අවලංගු වේ. ඒ තීරණය හේතුකොට ගෙන කාරක සභාවේ ඇතිවෙන පුරප්පාඩුව සමිතියේ අතුරු ව්‍යවස්ථා අනුව පිරවිය යුතුවේ.

ජර්නලය

7.6 ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී විසින් කොටස් 2කින් යුතු ජර්නලයක් පාවිච්චි කළ යුතුය. ඉන් එක් පිටපතක් අදාල සමිතිය වෙත භාර දිය යුතු අතර අනෙක් පිටපත ප්‍රදේශය භාර සමුපකාර සංවර්ධන උප කොමසාරිස් වෙත ඉදිරිපත් කල යුතුය. නියෝග 7.2 'අ' අනුව ලිඛිතව ඉදිරිපත් කරන ලද විරුද්ධතාවයන් ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී විසින් සමුපකාර සංවර්ධන උප කොමසාරිස් තැන වෙත ඉදිරිපත් කළ යුතුය. නියෝග 7.2 'ආ' අනුව ලිඛිතව ඉදිරිපත් කරන විරුද්ධතාවයන්ද ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී විසින් ප්‍රදේශ භාර සමුපකාර සංවර්ධන උප කොමසාරිස් වරයා වෙත භාර දිය යුතුය.

ජර්නලයේ ප්‍රථම කොටසේ පහත සඳහන් කරුණු සටහන් කළ යුතුය :—

(අ) සමිතියේ නම හා ලිපිනය ;
(ආ) ප්‍රාදේශික අංකය හා ලිපිනය ;
(ඇ) නාම යෝජනා භාරදුන් අපේක්ෂකයන්ගේ නම් හා ඒවා භාරදුන් වේලාවන් ;
(ඈ) නියෝග 7.1 යටතේ විරුද්ධතාවයන් ඉදිරිපත් කළ අයවළුන්ගේ නම් ලිපිනයන් හා ඒවා භාරදුන් වේලාවන් ;
(ඉ) නාම යෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කරන ලද අපේක්ෂකයන්ගේ නම් හා ප්‍රතික්ෂේප කිරීමට හේතු ;
(ඊ) නියෝග 7.2 (අ) හා 7.2 (ආ) යටතේ විරුද්ධතාවයන්ට ලක්වූ අපේක්ෂකයන්ගේ නම් වෙන් වෙන්ව සඳහන් කිරීම ;
(උ) නියෝග 9.2 යටතේ ඡන්ද අපේක්ෂකයන්ට වෙන්කර දුන් ඡන්ද සලකුණු හෝ සංකේත අංක.

7.7 ජර්නලයේ 2 වන කොටසේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය :—

(අ) ඡන්ද මධ්‍යස්ථානය.
(ආ) ඡන්දය ආරම්භ කළ දිනය හා වේලාව.
(ඇ) ඡන්ද විමසීම අවසන් කළ දිනය හා වේලාව.
(ඈ) ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී විසින් පාවිච්චි කළ මුද්‍රාවේ සලකුණ හා ආදර්ශ අත්සන.
(ඉ) පහත සඳහන් කරුණු ඇතුළත් ඡන්ද පත්‍රිකා ගිණුම.

(1) නරක්වූ ඡන්ද පත්‍රිකා හැර ඡන්ද දායකයන් වෙත නිකුත් කළ ඡන්ද පත්‍රිකා ගණන ....................
(2) නරක් වූ ඡන්ද පත්‍රිකා ගණන ... ... ... ....................
(3) පාවිච්චි නොකරන ලද ඡන්ද පත්‍රිකා ගණන... ... ... ....................

එකතුව ____________

(ඊ) ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී වෙත තිබූ ඡන්ද පත්‍රිකා ගණන....................
(උ) එක් එක් අපේක්ෂකයා ලැබූ ඡන්ද සංඛ්‍යාව.

(1) ....................
(2) ....................
(3) ....................
(4) ....................
(5) ....................
(6) ....................
(7) ....................
(8) ....................
(9) ....................
....................
....................
....................

මුළු එකතුව :

(ඌ) මෙම නියෝග මාලාවේ 8.2 සහ 8.1 අනුව තෝරා පත් කර ගන්නා ලද අපේක්ෂකයන්ගේ නම් :—

අටවන කොටස

ඡන්ද ක්‍රියා පිළිවෙල

8.1 නිතරග ඡන්ද විමසීම නිසි පරිදි නාම යෝජනා කරනු ලැබූ ඡන්ද අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව 9 ක් හෝ ඊට අඩු ගණනක් වූව හොත් එවැනි සෑම ඡන්ද අපේක්ෂකයාම තෝරා පත් වූ ලෙස සලකනු ලැබේ. එවිට ඡන්ද නිලධාරී තැන/සහකාර ඡන්ද නිලධාරී තැන ඒ බවට ලිඛිත ප්‍රකාශනයක් සමිතියේ ලේකම් තැනට නිකුත් කල යුතුවේ.

8.2 තරග සහිත ඡන්ද විමසීම.—නිසි පරිදි නාම යෝජනා කරන ලද ඡන්ද අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව 9 කට වැඩි වූ විට ඡන්ද නිලධාරී තැන/සහකාර ඡන්ද නිලධාරී තැන විසින් ඔවුන්ගේ නම් ඔවුනට වෙන් කර දුන් ඡන්ද සලකුණු ඡන්දය පවත්වන දිනය වේලාව හා ස්ථානය පිළිබඳව සමිතියට ලිඛිතව දැනුම් දිය යුතුය. අනතුරුව සමිතිය විසින් ඡන්ද දැන්වීම සකස් කර මුද්‍රණය කර ප්‍රචාරය කල යුතු අතර ඡන්ද පත්‍රිකාද මුද්‍රණය කර ඡන්ද නිලධාරීට/සහකාර ඡන්ද නිලධාරීට භාර දිය යුතුය.

8.3 ඡන්ද විමසීම පෙරවරු 9.00 ට අරඹා පස්වරු 4.00 ට අවසන් වන බව ඡන්ද විමසීම භාර ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී තැන නිවේදනය කල යුතුය.

8.4 මෙම රීති මාලාවේ නියෝග 11.2 අනුව සහකාර ඡන්ද නිලධාරී තැන විසින් නිකුත් කරනු ලබන මුද්‍රාව සහිත ඡන්ද පත්‍රිකා මගින් ඡන්ද විමසීම කල යුතුය.

ඡන්ද අපේක්ෂකයන්ට ඡන්ද සලකුණු වෙන්කර දීම

9.1. ඡන්ද නිලධාරී තැන/සහකාර ඡන්ද නිලධාරී තැන, ඡන්ද අපේක්ෂකයන්ගේ ගණන හා සමාන වූ ඡන්ද සලකුණු ගණනක් පාවිච්චි කළ යුතුය. ඡන්ද පත්‍රිකාවේ මුද්‍රිත අංක 1 දරණ සලකුණ සිට අනුක්‍රමික පිළිවෙළට ඇති සලකුණු ගණන මේ සඳහා තෝරා ගත යුතුය.

උද.—ඡන්ද අපේක්ෂකයන් 15 දෙනෙක් ඇත්නම් 1 සිට 15 දක්වා ඡන්ද සලකුණු තෝරා ගත යුතුය. ඒ ඡන්ද සලකුණු අතරින් කුසපත් ඇදීමේ ක්‍රමයෙන් එක් එක් ඡන්ද අපේක්ෂකයාට එක එක සලකුණක් වෙන් කර දිය යුතුය. එක එක ඡන්ද අපේක්ෂකයාට නියම කරන ලද ඡන්ද සලකුණ හා අනුක්‍රමික අංකය පිළිබඳ වාර්තාවක් ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී තැන තබා ගත යුතුය.

9.2 නියෝග මාලාවේ (ඇ) උපලේඛනයේ මුද්‍රිත ඡන්ද සලකුණු ප්‍රමාණවත් නොවන අවස්ථාවකදී ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී විසින් ඉතිරි අපේක්ෂකයන් සඳහා අනුක්‍රමික පිළිවෙලට අංක දිය යුතුය.

### ඡන්ද පත්‍රිකා

10.1 සෑම ඡන්ද පත්‍රිකාවක්ම මේ නියෝග මාලාවෙහි 'ආ' උපලේඛනයෙහි නියමිත පරිදි මුද්‍රණය කල යුතුය.

11.1 ඡන්ද නිලධාරී තැන/සහකාර ඡන්ද නිලධාරී තැන ඡන්ද විමසීමක් භාර ඡන්ද නිලධාරී තැන වශයෙන් ක්‍රියා කල යුතුය.

11.2 ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමට පෙර ඡන්ද නිලධාරී තැන/සහකාර ඡන්ද නිලධාරී තැන කිසිම අපේක්ෂකයෙකුට වෙන් කර හැකි ඡන්ද සලකුණු එක එක ඡන්ද පත්‍රිකාවෙන් කපා හැර පාවිච්චි කරනු ලබන එක එක ඡන්ද පත්‍රිකාවේ ප්‍රාදේශිකයේ මුද්‍රාවද තබා අත්සන් කල යුතුය.

11.3 ඡන්ද දායක ලැයිස්තුවේ නම ඇතුලත් වී තිබෙන ඕනෑම කෙනෙකුට තම සහල් සලාක පොත හෝ කැපැල් කන්තෝරු හැඳුනුම්පතේ පත්‍රය හෝ අමාත්‍ය රථ පැදවීමේ බලපත්‍රය හෝ සාමාජික පත්‍රය හෝ ගොවීන්ගේ හැඳුනුම්පතේ පත්‍රය හෝ ඡන්ද නිලධාරී තැන/සහකාර ඡන්ද නිලධාරී තැන විසින් පිළිගත හැකි වෙනත් ඒ සමාන ලියවිල්ලක් හෝ ඉදිරිපත් කර ඒ මගින් තමා හඳුන්වා දුන් විට ඡන්ද පත්‍රිකාවක් ලබා ගැනීමට බලය ඇත්තේය.

11.4 ඡන්දදායකයෙකුට ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමට පෙර ඒ ඡන්ද දායකයාගේ නම ඡන්දදායක ලැයිස්තුවෙහි සඳහන් වී ඇති බවට ඡන්ද පත්‍රිකාව නිකුත් කරන තැනැත්තා සෑහීමකට පත්විය යුතුය.

11.5 එක එක ඡන්දදායකයාට ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමත් සමගම ඡන්දදායක ලැයිස්තුවෙහි ඔහුගේ නාම සලකුණු කළ යුතුය.

11.6 එක ඡන්දදායකයෙකුට නිකුත්කළ හැක්කේ එක ඡන්ද පත්‍රිකාවක් පමණකි.

11.7 එක ඡන්දදායකයෙකුට තමන් කැමති එක එක ඡන්දපේක්ෂකයාට දිය හැකි වන්නේ එක ඡන්දයක් පමණකි. තවද එක ඡන්දදායකයකු විසින් ඡන්දය දියහැකි ඡන්දපේක්ෂකයන්ගේ උපරිම සංඛ්‍යාව 9 ක් වේ. යම්කිසි ඡන්දදායකයකු ඡන්ද අපේක්ෂකයන් 9 දෙනෙකුට වැඩි ගණනකට ඡන්දය දුනහොත් ඔහුගේ ඡන්ද පත්‍රිකාව නරක් වූ එකක් ලෙස සලකනු ලැබේ.

11.8 ඡන්ද පත්‍රිකාව ලබා ගත් විට එක එක ඡන්දදායකයා තම කැමැත්ත පරිදි එහි එක එක ඡන්ද සලකුණ සහ/හෝ අංකය කෙලින් ඒ කොටුවෙහි ලකුණක් තබා තම කැමැත්ත දක්විය යුතුය. ඉන් පසු ඡන්ද නිලධාරී තැන/සහකාර ඡන්ද නිලධාරී තැන ඉදිරියෙහි තබා ඇති ඡන්ද පෙට්ටියට ඒ ඡන්ද පත්‍රිකාව දැමිය යුතුය.

11.9 ශාරීරික බාධාවක් නිසා ඡන්ද පත්‍රිකාව ලකුණු කල නොහැකි ඡන්දදායකයෙකුට තමා වෙනුවෙන් ඡන්ද පත්‍රිකා ලකුණු කරන ලෙස ඡන්ද නිලධාරී /සහකාර ඡන්ද නිලධාරී තැනගෙන් ඉල්ලා සිටිය හැකිය.

11.10 පස්වරු 4 ඡන්ද නිලධාරී තැන/සහකාර ඡන්ද නිලධාරී තැන ඡන්ද විමසීම අවසන් කල බව ප්‍රකාශ කල යුතුවේ.

### ගණන් කිරීම

12.1 ඡන්ද විමසීම අවසන් වූ වහාම ඡන්ද නිලධාරී/ සහකාර ඡන්ද නිලධාරී එවකට ලබා ගත හැකි සහාය ඇතිව ඡන්ද පෙට්ටියේ ඡන්ද ගණන් කිරීම ආරම්භ කල යුතු වේ. මේ සඳහා පහත දැක්වෙන 12.2 හා 12.3 නියෝග යටතේ තමා විසින් ප්‍රතික්ෂේප කර නැති සියලුම ඡන්ද ගණන් ලකුණු කරන කොළ උපයෝගී කොට ගණන් කල යුතුය.

12.2 ඡන්ද අපේක්ෂකයන් 9 දෙනෙකුට වැඩි ගණනක් සඳහා කැමැත්ත ලකුණු කර ඇති ඕනෑම ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කිරීමට ඡන්ද නිලධාරී තැනට/සහකාර ඡන්ද නිලධාරී තැනට බලය ඇත්තේය.

12.3 යම්කිසි ඡන්ද පත්‍රිකාවක ඡන්ද දායකයා ඡන්දය දී ඇත්තේ ඡන්ද අපේක්ෂකයින් දෙදෙනෙකුගෙන් කවරෙකුටදැයි යන්න පැහැදිලිව දැන ගත හැකි පරිදි නොවේ නම් ඒ ඡන්දය ප්‍රතික්ෂේප කර ඉතිරි ඡන්ද පිළිගැනීමට ඡන්ද නිලධාරී තැනට/සහකාර ඡන්ද නිලධාරී තැනට බලය ඇත්තේය.

12.4 ඡන්දදායකයෙකු විසින් යම්කිසි ඡන්ද පත්‍රිකාවක ඡන්ද අපේක්ෂකයෙකුට කැමැත්ත දැක්වීම සඳහා ලකුණු එකකට වැඩි ගණනක් සඳහන් කර තිබුණත් ඒ සියල්ල එක ඡන්දයක් ලෙස සලකනු ලැබේ.

12.5 නියෝග මාලාවේ 12.2 සහ 12.3 යටතේ ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී විසින් ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා ගණන් කර ගොනු කර ඡන්ද පත්‍රිකා ශේෂය හා සමග තුලනය කල යුතුය.

### ඡන්ද ප්‍රතිඵල

13.1 ඡන්ද ගණන් කර අවසන් වූ විට, අනිකුත් අයට වඩා වැඩි ඡන්ද ගණනක් ලත් ඡන්දාපේක්ෂකයින් 9 දෙනා ප්‍රාදේශික කාරක සභිකයින් වශයෙන් තෝරා පත්වූ ලෙස පිළිගනු ලැබේ.

ඡන්දාපේක්ෂකයින් දෙදෙනෙකුට හෝ වැඩි ගණනකට එක සමාන ඡන්ද ගණනක් ලැබුණහොත්, ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී අවශ්‍ය අවස්ථාවලදී ඔවුන් අතුරෙන් කාරක සභාවට තෝරා පත් විය යුතු ඡන්දාපේක්ෂකයා හෝ ඡන්දාපේක්ෂකයින් කුසපත් ඇදීමෙන් තීරණය කළ යුතුය. එහෙත් ඡන්දාපේක්ෂකයින් කිහිප දෙනෙකුට එක සමාන ඡන්ද ලැබුණත්, කාරක සභාවට අවශ්‍ය ඡන්දාපේක්ෂකයින් සංඛ්‍යාව නිශ්චිත වශයෙන් තෝරා පත් කර ගැනීමට හැකිනම් එසේ කුසපත් ඇදීම අවශ්‍ය නොවන්නේය.

13.2 ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී, කාරක සභාවට තෝරා පත්වූ ඡන්දාපේක්ෂකයින්ගේ නම් සඳහන් කරමින්, ඡන්ද විමසීමේ ප්‍රතිඵල සමිතියට ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. එහි පිටපතක් ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී ප්‍රදේශයේස.සං.උපකොමසාරිස් තැන වෙතද යැවිය යුතුය.

13.3 එසේ තෝරා පත්වූ සාමාජිකයින්ගේ නම් සමිතියේ ලේකම් තැන විසින් ඒ ප්‍රාදේශිකයෙහි කාර්යාලයෙහි සහ මෙවළඳ කටයුතු කරන ස්ථානයෙහි දින 10 ක් තුළ ප්‍රකට ලෙස ප්‍රදර්ශනය කළ යුතුය.

14.1 ඡන්ද විමසීම පැවැත්වීම සම්බන්ධයෙන් ඇතිවන ඕනෑම ප්‍රශ්නයක් ගැන ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී තැනගේ තීරණය තීරණාත්මක අවසාන තීරණය වන්නේය.

### 4 වන කොටස

### විවිධ කරුණු

15.1 ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ කළායින් පසු ඡන්ද නිලධාරී/ සහකාර ඡන්ද නිලධාරී විසින්—

(i) පාවිච්චි නොකරන ලද පත්‍රිකාද ලකුණු කරන ලද ඡන්දදායක ලැයිස්තුවද සියළුම නාම යෝජනා පත්‍රද නියෝග මාලාවේ 7.6 සහ 7.7 අනුව පිළියෙල කරන ලද ජර්නලයේ පිටපතක්ද කවරයක බහා සිල් තබා සමිතියේ ප්‍රධාන කාර්යාලයට යැවිය යුතුය.

(ii) නරක් වූ ඡන්ද පත්‍රිකාද නියෝග මාලාවේ අංක 7.6 සහ 7.7 යටතේ පිළියෙල කරන ලද ජර්නලයේ මුල් පිටපතද සලකුණු කරන ලද නරක් වූ ඡන්ද පත්‍රිකාද කවරයක බහා සිල් තබා ප්‍රදේශය භාර සමූපකාර සංවර්ධන උපකොමසාරිස්වරයා වෙත යැවිය යුතුය.

16. සමිතියක ප්‍රාදේශික කාරක සභාවේ සාමාජිකයින් තෝරා පත් කිරීම සම්බන්ධයෙන් ඇතිවන සියළුම වියදම් සමිතිය විසින් දැරිය යුතුවේ.

17. (ආ) උපලේඛනය ඇතුළුව මේ නියෝගවලට තවත් ඇතුළත් කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට හෝ බලය කොමසාරිස්ට ඇති වන්නේය.

18. මේ නියෝගවල අර්ථ නිරූපනය සම්බන්ධයෙන් යම්කිසි ආරාවුලක් ඇතිවුවහොත් ඒ සම්බන්ධයෙන් කොමසාරිස්තුමාගේ තීරණය අවසාන හා තීරණාත්මක තීරණය වන්නේය.

5 වන කොටස

අර්ථ නිරූපණය

19.1 මෙම නියෝගවල 'අතුරු ව්‍යවස්ථා' යනු සමිතියේ එවකට බලපාන ලියාපදිංචි කළ අතුරු ව්‍යවස්ථාය. අතුරු ව්‍යවස්ථාවල ලියාපදිංචි කළ සංශෝධනද ඊට ඇතුළත්වේ.

19.2 7(2) (අ) 17 සහ 18 නියෝගයන් හැර අනෙක් නියෝගවල "කොමසාරිස්" යනු සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමා හෝ "සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්වරයකු" හෝ "සමුපකාර සංවර්ධන ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස්වරයකු" හෝ "සමුපකාර සංවර්ධන උපකොමසාරිස්වරයකු" හෝ ඉහත සඳහන් කෙනෙකු විසින් නිසි පරිදි බලය පවරන ලද අනිකක් කෙනෙකු හෝ වන්නේය.

19.3 7(2) (අ) 17 සහ 18 වෙනි නියෝගයන්හි "කොමසාරිස් යනු "සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාය."

19.4 මෙම නියෝග මාලාව අනුව ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි යනු ඡන්දය පැවැත්වෙන ප්‍රාදේශික බල ප්‍රදේශය භාර උපකොමසාරිස්වරයා විසින් ඡන්දය විමසීම සඳහා පත් කරනු ලබන පුද්ගලයින් වේ.

19.5 ඡන්දදායකයා යනු සමිතියක යම්කිසි ප්‍රාදේශික බල ප්‍රදේශයක සාමාජිකයෙකු වශයෙන් ප්‍රාදේශික කාරක සභාවක් පත් කර ගැනීම සඳහා සංගනිත කරන ලද ඡන්ද නාම ලේඛනයේ නම සඳහන් පුද්ගලයෙකි.

"අ" උපලේඛනය

නාම යෝජනා පත්‍රය

1. සමිතියේ නම හා ලිපිනය :———.
2. ප්‍රාදේශිකයේ අංකය හා ලිපිනය :———.
3. ඡන්දාපේක්ෂකයාගේ, යෝජකයාගේ හා ස්ථිරකරුගේ විස්තර :—

| | ඡන්දාපේක්ෂකයා | යෝජකයා | ස්ථිරකරු |
|---|---|---|---|
| සම්පූර්ණ නම :<br>වයස :<br>ලිපිනය :<br>සාමාජික අංකය : | | | |

4. සමුපකාර සමිතියක ප්‍රාදේශික කාරක සභාවක් තෝරා පත් කිරීම පිළිබඳ නියෝග මාලාවේ 5.2 නියෝගය යටතේ අවශ්‍ය වන පරිදි ඡන්දාපේක්ෂකයාගේ ප්‍රකාශනය මීට අමුණා ඇත.

..............................
ඡන්දාපේක්ෂකයාගේ අත්සන.

..............................
යෝජකයාගේ අත්සන.

දිනය :..................

..............................
ස්ථිරකරුගේ අත්සන.

"ආ" උපලේඛනය

සමුපකාර සමිතියක ප්‍රාදේශික කාරක සභාවක් තෝරා පත් කිරීම සඳහා සකස් කරන ලද නියෝග මාලාවේ 5.2 නියෝගය යටතේ ප්‍රකාශනය

.............................................. වන මම, සීමාසහිත .............................................. සමුපකාර සමිතියේ අංක .............................................. දරණ ප්‍රාදේශිකයේ කාරක සභාවට මා තෝරා පත් කිරීම සඳහා මාගේ නාම යෝජනා කිරීමට මෙයින් කැමැත්ත දෙමි. තව ද, අංක .............................. හා .............................. දින දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශිත, සමුපකාර සමිතියක ප්‍රාදේශික කාරක සභාවක් තෝරා පත් කිරීම සඳහා සකස් කරන ලද නියෝග මාලාවේ 4.1 වෙනි නියෝගයේ සඳහන් නුසුදුසුකම් කිසිවකින් මා නුසුදුසු නොවන බව ද ප්‍රකාශ කරමි.

දිනය :..................

..............................
ඡන්දාපේක්ෂකයාගේ අත්සන.

(ආ) 1 උපලේඛනය

යෝජනාකරුගේ හා ස්ථිරකරුගේ ප්‍රකාශනය

.............................................. වන මම, සීමාසහිත .............................................. විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාජිකයෙක් බව සහතික කරන අතර උපලේඛන "අ" හි සඳහන් මා විසින් අත්සන් තබා සහතික කරන ලද කරුණු මගේ දැනීමේ හැටියට සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමි.

..............................
යෝජනාකරු/ස්ථිරකරු අත්සන.

දිනය :..................

..............................
යෝජනාකරු/ස්ථිරකරුගේ නම.

"ඇ" උපලේඛනය

සමුපකාර ප්‍රාදේශික කාරක සභා තෝරා ගැනීමේ කටයුතු කිරීම සඳහා ඡන්ද නිලධාරීන්/සහකාර ඡන්ද නිලධාරීන් පත් කිරීමේ ලිපියක ආදර්ශ ආකෘතිය

සී/ස. .............................................. විවිධ සේවා සමුපකාර සමිතියේ අතුරු ව්‍යවස්ථා මාලාවේ 23 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ ස. සං. කො./රෙ. විසින් සනාථ කරන ලද රෙගුලාසි මාලාවේ 3(1) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව හා අංක ............... දින දාතම ජනරජයේ ගැසට් පත්‍රයේ නිවේදනයට අනුව 1972 අංක 5 දරණ සමුපකාර නීතිය යටතේ ලියා පදිංචි කරන ලද හා ලදැයි සැලකිය හැකි හා 1970 අංක 35 (විශේෂ විධි විධාන පනත) දරණ පනත සමග කියවෙන පරිදි ඉහත කී සමිතියේ අංක .............................. ප්‍රාදේශිකයට කාරක සභාවක් පත් කර ගැනීම සඳහා ඡන්ද විමසීම නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි වශයෙන් .............................................. මහතා/මිය./මෙනවිය මෙයින් පත් කරමි.

..............................
අත්සන.

..............................
නම.
ස. සං. උප/කොම,

දිනය :..................